කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2014/15

2019 පෙබරවාරි - අප්‍රේල්

මානව ශාස්ත්‍ර පීඨය

# සිංහල

## චිරන්තන සිංහල පද්‍ය කාව්‍ය හා විචාර කලාව SINH – E 3015

පළමු කොටසේ පළමුවන ප්‍රශ්නයත්, දෙවන හා තෙවන කොටස්වලින් ප්‍රශ්න දෙක (02) බැගිනුත් තෝරා ගෙන ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

### I කොටස

01. (අ) පහත දැක්වෙන ගීවල අර්ථ ලිහිල් බසින් ලියන්න.

(මළ වි ද ඔයු) න් රත් අතින් ගත් බ(ව) මල් දම්
ඇ(නිවෙ) ය් දු ලයු තොප් ගල්කළ තද්ළ ඇත්තෙන් මුත්

කි වරජ ද මලදම හිමබුයක අතැ දි(ටි)
මන ගති මා දෙතා බෙයද බෙලුම වනනෙය

(නැත්ත) ක් නො කී මා ඇති බැවින් ම ඇස්හි දිසි
තමා මෙ (ග)ල් බෙ(ය)න්ද් ගොස් නැති ද
ඇති ද බලය් ග(න්)

(ලකුණු 10 යි)

(ආ) පහත දැක්වෙන ගීවල අර්ථ ලිහිල් බසින් ලියන්න.

දැනවීමෙන් නුවනන රත උවනත සේ බිඳු
ලවනත කැලුම් බීමෙන් සිරි ලද මී පිය පියන්

මත පුරයෝනන් උවනත සඳකැල්මේ
පළ සේ බිඳු ගහ ගහළ සිනේ සිසිලේ වන් වී

වැලලත එකක කතක බිබී දුනඩ බැල්මෙන්
මිහිවිත් උතුළ වන් වී නරනිඳු රතුපුල් දෙලෙන් (ලකුණු 10 යි)

(ඇ) පහත දැක්වෙන පද්‍යවල අර්ථ ලිහිල් බසින් ලියන්න.

පැහැදි සරම්බා රැඳි මත රම්බා
තුනු සිරි රම්බා පති පිළි බිම්බා
රුපු රජ රම්බා රන මත කුම්බා
දින පැරකුම්බා හිමි තෙවි කුම්බා

ර න ගල තළ යුරු පැහැසර පුළු ලුර
මෙන දෙව් රජ ගජ කර දිගු යුග කර
ම න පිනවන පුල් සල් තුරු සිරිබර
දි න කැත් කුල මිණි පැරකුම් නරවර

ලකැතුන් රට මුළු දඹදිව පිළිබඳ
තිරි දුන් බිඟු කැන් ගුණ සුවඳින් සොඳ
අවු දින් ගෙනැ යන රන් මිණි මුවරඳ
මෙ රදුන් සරණත තඹරෙකි මනනඳ

(ලකුණු 10 යි)

(ඇ) පහත දැක්වෙන පද්‍යවල අර්ථ ලිහිල් බසින් ලියන්න.

දිය දිය ගොස පළ කෙරෙමින් සපැමිණි
ගිය ගිය තැන ඉස්වා රන් මුතු මිණි
ගිය ගිය දියනද එන මෙන් ගෙන රැණි
සිය සිය ගුණයෙන් වෙණනද නික්මිණි

ප ය ස න් නොව බිඟුදැල් රැඳි කොපුලී
අ ව ස න් නොව වෙණනදටම කුහුලී
ම ද ස න් සුන් පියොවින් සිටි නොසැලී
ග ජ සෙ න් සිතියම් ගජ සිරි කියලී

කන් කලු වෙණනද ඇසුමෙහි ලොබිනේ
රන් රසු දැල් කොලහල වන බියෙනේ
සන් සල නොව එහි පිළිරූ ලෙසිනේ
නන් හයසෙන් සිටියෝ සිටි මතිනේ

(ලකුණු 10 යි)

## II කොටස

02. "සීගිරි ගී වනාහි අලංකාරවාදයට අනුගත නොවූ දේශීය පද්‍ය සම්ප්‍රදායක යථා ස්වභාවය අධ්‍යයනයට උපස්තම්භක වන පද්‍ය සමුච්චයකි." මේ පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

03. සංස්කෘත කාව්‍ය සම්ප්‍රදායට අනුගත වෙමින් ජාතක කථා පද්‍යයට නැඟීමෙහිලා පොළොන්නරු යුගයේ කවීන් දැක්වූ සාමර්ථ්‍යය කෙබඳුදැයි සනිදර්ශනව පහදන්න.

04. කුස ජාතක කථා ප්‍රවෘත්තිය සමඟ මහා කාව්‍ය ලක්ෂණ අවියෝජනීය ලෙස බද්ධ කිරීමට කව්සිළුමිණ කවියා දැක්වූ කුසලතාව පහදන්න.

05. සිංහල ප්‍රශස්ති කාව්‍ය කෘති අතුරින් පැරකුම්බා සිරිත විශිෂ්ටත්වයට පත්වන්නේ කවර කරුණු පදනම්කොට ගෙනදැයි සනිදර්ශනව සාකච්ඡා කරන්න.

06. ගුත්තිල කාව්‍ය කතුවරයා විසින් අනුගමනය කරන ලද ස්වාධීන කාව්‍ය රීතිය පිළිබඳ විමර්ශනයක් කරන්න.

## III කොටස

07. සංස්කෘත කාව්‍ය විචාරයේ ප්‍රභවය හා ව්‍යාප්තිය පිළිබඳව ප්‍රමාණාත්මක විග්‍රහයක් කරන්න.

08. පහත දැක්වෙන විචාරවාදවලින් එකක් පිළිබඳ ප්‍රාමාණික විවරණයක් සපයන්න.

අ. රසවාදය

ආ. ධ්වනිවාදය

ඇ. වක්‍රොක්තිවාදය

09. සමාජ විද්‍යාත්මක විචාරය යනු කුමක්දැයි පැහැදිලි කොට, ඊට ආවේණික ලක්ෂණ කවරේදැයි සාකච්ඡා කරන්න.

10. ප්‍රායෝගික විචාරය පිළිබඳ විශ්ලේෂණාත්මක විග්‍රහයක් කරන්න.

(02 සිට 10 දක්වා සෑම පිළිතුරකටම ලකුණු 15 බැගින් ප්‍රදානය කෙරේ.)

******************************